# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,753 - 2012 අප්‍රේල් මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2012.04.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I කොටස : (III) වැනි ඡේදය - වෙළෙඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.


| | පිටුව |
|---|---|
| වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම් … … | — |
| වෙළෙඳ ලකුණු පිළිබඳ නිවේදන … … | — |
| පේටන්ට් බලපත්‍ර පිළිබඳ නිවේදන … … | 144 |
| කාර්මික සැළසුම් පිළිබඳ නිවේදන … … | — |
| විවිධ දැන්වීම් … … | — |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන්, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නො ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 අප්‍රේල් මස 11 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 මාර්තු මස 30 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට භාරදිය යුතු ය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08.
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

143 - B 80348 — 3,050 (2012/04)

# වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම්

### වෙළඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළඳ ලකුණුවලට අදාළ සියලු ම ලියුම් කියුම් කොළඹ 10, ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 400, "සමාගම් මැදුරේ" 3 වැනි මහලේ පේටන්ට් බලපත්‍ර සහ සහ වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ පේටන්ට් බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතු ය.

### පරීක්ෂා කිරීමේ වේලාවන්

සතියේ සෑම ක්‍රියාකාරී දිනක ම පෙරවරු 9.00 සිට පස්වරු 3.30 දක්වා ලේඛන පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා ඉල්ලුම්පත්‍ර සතියේ වැඩ කරන දිනවල පස්වරු 2.00 දක්වා පමණක් භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළෙඳ ලකුණු

ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළෙඳ ලකුණක් යම් යම් වර්ණයකට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමග ඉදිරිපත් කරනු ලබන වෙළඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

### ආශ්‍රිත කිරීම

මෙහි පළ කර ඇති ලකුණක් , 1979 අංක 32 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහ පනතේ 112 වැනි වගන්තිය යටතේ, තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිතා කරනු ලබන බවට සඳහන් කර ඇති කල්හි එම වෙළෙඳ ලකුණට දී ඇති අංකය ද දක්වනු ලැබේ.

### විරෝධතා දැක්වීම

පහත සඳහන් වෙළෙඳ සේවා හෝ සාමූහික ලකුණු ලියාපදිංචි කිරීම ගැන විරෝධතාවය දැක්වීමට හේතු ඇති යම් කෙනෙකු මෙම *ගැසට්* නිවේදනයේ දින සිට තුන් මාසයක් ඇතුළත ඇම් 2 දරන ආකෘති පත්‍රය (අනු පිටපතකින් ද යුක්තව) මගින් විරෝධතා දැක්වීම ඉදිරිපත් කළ යුතු ය. එබඳු විරෝධතා දැක්වීමක් සඳහා ගාස්තුව රු. 750ක් වන අතර එම ගාස්තුව මුදලින්, චෙක්පතකින්, මුදල් ඇණවුමකින්, තැපැල් ඇණවුමකින් හෝ බැංකු අණකරයකින් ගෙවිය යුතු ය.

# පේටන්ට් බලපත්‍ර පිළිබඳ නිවේදන

**බුද්ධිමය දේපළ පනත 2003 අංක 36 (79 (2) (ආ) වගන්තිය)**

මෙම නිවේදනය පළ කිරීමෙන් මාස 3ක් ඉකුත් වීමෙන් පසුව පහත සඳහන් ඉල්ලුම්කරුවන්ට පේටන්ට් බලපත්‍ර ලබා දීමට හැකි බව මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| (1) ඉල්ලුම්පත්‍ර අංකය : 13870 | (2) ඉල්ලුම්කරු : ඒ. ඩී. ටර්නර් ලිමිටඩ් | (3) නව නිර්මාණයේ නම : වටකරන යන්ත්‍රය |
| (1) ඉල්ලුම්පත්‍ර අංකය : 14123 | (2) ඉල්ලුම්කරු : හචිසන් වැම්පෝවා ත්‍රී G IP බහමාස් ලිමිටඩ් | (3) නව නිර්මාණයේ නම : පුෂ් ටු වොච් : පුද්ගල ප්‍රවාහන යෙදුමට පුද්ගලික වීඩියෝවක් |
| (1) ඉල්ලුම්පත්‍ර අංකය : 15718 | (2) ඉල්ලුම්කරු : හේවා කලුවන් අක්කලාගේ තෂ්මිලා ධනන්ජනී | (3) නව නිර්මාණයේ නම : බදාම දැමීමෙන් තොරව ඇඟිලිවලින් සවි කළ හැකි සෙවිලි උලු සහ ඇස්බැස්ටෝස් වහළ උලු |
| (1) ඉල්ලුම්පත්‍ර අංකය : 15933 | (2) ඉල්ලුම්කරු : රාමවික්‍රම ගමාච්චිගේ රවීන්ද්‍ර | (3) නව නිර්මාණයේ නම : තාප ශක්තිය පිරිමසාලන කේතලය |
| (1) ඉල්ලුම්පත්‍ර අංකය : 15936 | (2) ඉල්ලුම්කරු : සැන්ගුගේ සරත් රන්ජිත් ජයතිලක | (3) නව නිර්මාණයේ නම : සූර්ය පරාවලයික DCP ස්ටර්ලිං සහ ටර්බයින එන්ජින් අලුත්වැඩියා කළ හැකි විද්‍යුත් උත්පාදන පද්ධතිය |
| (1) ඉල්ලුම්පත්‍ර අංකය : 16075 | (2) ඉල්ලුම්කරු : ලොකුමානගේ උෂාන්ත දම්මික | (3) නව නිර්මාණයේ නම : හෝස් එකලස් කිරීමේ යන්ත්‍රය |
| (1) ඉල්ලුම්පත්‍ර අංකය : 16118 | (2) ඉල්ලුම්කරු : අමරසිංහ පතිරණගේ සුදත් ලක්ෂ්මන් විජේසිංහ | (3) නව නිර්මාණයේ නම : ගැට දෙක සහිත කොහු තනන යන්ත්‍රය |
| (1) ඉල්ලුම්පත්‍ර අංකය : 16130 | (2) ඉල්ලුම්කරු : නවරත්න මුදියන්සේලාගේ මහගෙදර සෙනෙවිරත්න බණ්ඩාර නවරත්න | (3) නව නිර්මාණයේ නම : නියොලිටිසියා ඉන්වොලුයුක්‍රේට් (දවුල්කරුඳු හෝ කුඩුදවුල) මගින් ආහාරයට ගත හැකි පැල ජල්ලි අවාරණය කිරීමෙන් කෙසෙල්වලින් අල සඳහා අතිරේක නිෂ්පාදනයක් සෑදීම |

(1) ඉල්ලුම්පත්‍ර අංකය : 16374 (2) ඉල්ලුම්කරු : දසනායකගේ සෙනරත් සමරසිංහ (3) නව නිර්මාණයේ නම : කාර්යක්ෂම දහයියා කවනය

(1) ඉල්ලුම්පත්‍ර අංකය : 16536 (2) ඉල්ලුම්කරු : විද්‍යා ජෝති ආචාර්ය කරන්නාගොඩ කන්කාම්ලාගේ යසරත්න විජේසුන්දර පෙරේරා (3) නව නිර්මාණයේ නම : සීලිං විදුලි පංකා සඳහා ස්වයංක්‍රීය ඉලෙක්ට්‍රොනික් කාල සහ වේග පාලකය සහ ඒ හා සමාන උපකරණ සඳහා ටයිමර්

04-250

# ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු
## 2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවක් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා වේ.
4. මුදල් ගණුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇණවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිතුමාට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි වටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් සහ වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තුව මෙසේ යි:-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137.00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137.00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකට ... ... ... | 1,300.00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600.00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපතිතුමාට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන සංශෝධිත දායක ගාස්තුව:-**

*** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 2,080.00 | 3,120.00 |
| II වැනි ඡේදය(පළකිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය ... ... | 1,300.00 | 3,120.00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 780.00 | 3,120.00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් ( I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160.00 | 6,240.00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 580.00 | 3,120.00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 405.00 | 3,120.00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්)... ... ... | 890.00 | 2,400.00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 860.00 | 420.00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 260.00 | 180.00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... | 5,145.00 | 5,520.00 |

*(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොළාස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය.)*

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | *පිටපතක මිළ* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 40.00 | 60.00 |
| II වැනි ඡේදය(පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය ... ... | 25.00 | 60.00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 15.00 | 60.00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් ( I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80.00 | 120.00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 12.00 | 60.00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 12.00 | 60.00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්)... ... ... | 23.00 | 60.00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 123.00 | 60.00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 87.00 | 60.00 |

*කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යාංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි. -** මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| මාසය | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| | **2011** | | | | | |
| අප්‍රේල් | 2012.04.05 | බ්‍රහස්පතින්දා | 2012.03.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.04.11 | බදාදා | 2012.03.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.04.20 | සිකුරාදා | 2012.04.05 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2012.04.27 | සිකුරාදා | 2012.04.11 | බදාදා | දහවල් | 12.00 |
| මැයි | 2012.05.04 | සිකුරාදා | 2012.04.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.05.11 | සිකුරාදා | 2012.04.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.05.18 | සිකුරාදා | 2012.05.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.05.25 | සිකුරාදා | 2012.05.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූනි | 2012.06.01 | සිකුරාදා | 2012.05.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.08 | සිකුරාදා | 2012.05.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.15 | සිකුරාදා | 2012.06.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.22 | සිකුරාදා | 2012.06.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.29 | සිකුරාදා | 2012.06.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.